**ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන වෙනුවෙන් වාරික ගෙවීම සඳහා වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන සලසා නොගෙන, ඒ සඳහා මු.රෙ. 66 යටතේ රු.3,000,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන, ඉන් රු.2,710,399 ක වියදමක් දරා තිබුණි. | රට තුළ පැවති අයහපත් ආර්ථික වාතාවරණය හේතු කරගෙන කල්බදු වාහන මිලදී ගැනීම සඳහා 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොමැත. එම වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වාහන අවශ්‍යතාවය සම්පූර්ණ කරගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය මඟින් වාහන ලබා දී ඇත. පසුව අමාත්‍යාංශය මඟින් අදාළ වියදම් මෙම දෙපාර්තමේන්තුවෙන් දරන ලෙස ලබා දුන් උපදෙස් අනුව මු.රෙ. 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කරගන්නා ලදී. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ආ) වැය විෂය 242-1-1-0-1102 සඳහා මු.රෙ 66 මඟින් රු.500,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන, ඉන් රු.18,752 ක් පමණක් වැයකර රු.431,248 ක් හෙවත් සියයට 86 ක් ඉතිරි කර තිබුණු බව නිරීක්ෂණය විය. | මු. රෙ. 66 යටතේ අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගත්ත ද අමාත්‍යාංශය මඟින් එම පුහුණු අවස්ථා අනුමත නොවීම මත ප්‍රතිපාදනය ඉතිරි වී ඇත. | එම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **දත්ත පද්ධතිය පවත්වාගෙන යාම** | | |
| භාණ්ඩාගාර ලේකම් සහ මුදල් හා ක්‍රමසම්පාදන ලේකම්ගේ අංක DMS/E/1/99 හා 1999 මැයි 05 දිනැති චක්‍රලේඛය අනුව පිහිටුවන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රථම | දැනට දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන අනුමත සහ තත්‍ය කාර්යය මණ්ඩලයට අදාළ පැතුරුම්පත් | ප්‍රමාදයන්ගෙන් තොරව සැලසුම්වලට අනුකූලව |

| | | |
|---|---|---|
| පියවර වශයෙන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තුළ පොදු දත්ත මූලාශ්‍රයන් පිහිටුවීමට හා විවිධ නියෝජිත ආයතන අතර අපිළිවෙලට විසිර පවත්නා දත්ත, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යටතේ ඒකාබද්ධ කොට යාවත්කාලීන කොට කේන්ද්‍රගත කිරීමට යෝජනා වී තිබූ අතර, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ලෙසට රාජ්‍ය අංශයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සේවක පිරිස පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණි. එසේවුවද, දෙපාර්තමේන්තුව පිහිටුවා සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 24 ක පමණ කාලයක් ගතවී තිබුණ ද, දත්ත පද්ධතියක් නිර්මාණය කර නොතිබුණි. | මගින් ලබා ගන්නා සියලු දත්ත වාර්තා පරිගණකගත දත්ත සමුදාය කළමනාකරණ පද්ධතිය ඔස්සේ ඉටු කර ගැනීම සම්බන්ධ මූලික කාර්යයන් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මේ වන විටත් සිදු කරමින් පවතී. | කටයුතු කළ යුතු වීම. |
| (ආ) **රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම** | | |
| 2017 අගෝස්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, සියලුම රාජ්‍ය ආයතනවල නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යාම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යෑම් වැනි කරුණුවලට අදාළව සිදුවන වෙනස්වීම් දක්වමින් රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳව කාර්තුමය වශයෙන් යාවත්කාලීන කරන ලද තොරතුරු, දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී තිබුණ ද, 2019 පළමු කාර්තුවෙන් පසු අදාළ කාර්ය මණ්ඩල තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩලය වෙත කාර්තුමය වශයෙන් වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවන බැවින් වාර්ෂිකව වාර්තා ඉදිරිපත් කිරීමට මෙම වසරේ සිට කටයුතු කරනු ලැබේ. | අමාත්‍ය මණ්ඩල උපදෙස් අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) **තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු පවත්වාගෙනයාම** | | |
| 2017 අගෝස්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, සියලුම රාජ්‍ය ආයතනවල නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අත්හැර යාම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යෑම් වැනි කරුණුවලට අදාළව සිදුවන වෙනස්වීම් දක්වමින් රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාමේ හා යාවත්කාලීන කිරීමේ වගකීම, දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණද, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ වාර්ෂික | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සැකසීමේ දී ඇතුළත් නොවී ඇති කාර්ය මණ්ඩල තොරතුරු ප්‍රමාණය මුළු අනුමත කාර්ය මණ්ඩලයෙන් 0.6% ක් වැනි සුළු ප්‍රතිශතයක් වන අතර එම තත්ත්වය ද නිවැරදි කිරීමට මේ වන විටත් කටයුතු කරමින් පවතී. | වාර්තා සඳහා දත්ත, සම්පූර්ණව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| වාර්තාව සැකසීමේදී රජය සතු ව්‍යාපාර ආයතන 32 ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ විශේෂ වියදම් ඒකකවලට අදාළ ආයතන 52 ක් වශයෙන් එකතුව ආයතන 84 ක පවතින කාර්ය මණ්ඩල විස්තර ඇතුළත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) 2017 ජනවාරි 21 දිනැති අංක 01/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි රාජ්‍ය ආයතනවල කාර්යයන් ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය හඳුනාගෙන, ඒ පිළිබඳව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීමට හා එම තොරතුරු පදනම්ව කාර්ය මණ්ඩල සමාලෝචන කමිටුවක් මඟින් එක් එක් ආයතනයට අවශ්‍ය ප්‍රශස්ත කාර්ය මණ්ඩලය තීරණය කිරීමට නියමිතව තිබුණි. එසේවුවද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් චක්‍රලේඛය නිකුත් කර වසර 05 ක් ඉක්මවී තිබුණ ද, රාජ්‍ය ආයතන 1027 ක් අතරින් ආයතන 765 ක කාර්යමණ්ඩල සමාලෝචන වාර්තාවන් ලබා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. | රාජ්‍ය අංශයේ ආයතනික කාර්යමණ්ඩල සමාලෝචනය මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයක් වන බැවින් කාර්යය මණ්ඩල සමාලෝචනය සිදු කළ යුතු ආයතන හඳුනා ගනිමින් කාර්යය මණ්ඩල සමාලෝචන අඛණ්ඩව සිදු කිරීමට කටයුතු කෙරේ. | දක්වා ඇති චක්‍රලේඛයට අනුව හා දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යය අනුව කාර්ය මණ්ඩල සමාලෝචන සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මිල සැඳහුම් ක්‍රමයට ප්‍රසම්පාදන සිදු කිරීමේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කළ යුතු බව දක්වා තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීමෙන් තොරව අවස්ථා 03 කදී එකතුව රු.798,973 ක් වූ භාණ්ඩ මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි. | 2024 වර්ෂයේ සිට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම සඳහා කටයුතු කර ඇත. | චක්‍රලේඛ විවිධිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 3.3 වත්කම් කළමනාකරණය

### (අ) වාහන

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ මාර්තු 04 දින අනතුරට පත්ව තිබුණු KE-6438 රථයට සිදු වූ හානියට අදාළව රු.61,959.58 ක මුදල අයකර ගැනීම සඳහා වගකිව යුතු පාර්ශවය නිශ්චය කිරීම 2023 දෙසැම්බර් 31 දින වන විටත් සිදු වී නොතිබුණි. | අනතුරට අදාළ පොලිස් පරීක්ෂණ වාර්තාව ලබා දී නොමැති බැවින් වගකිව යුතු පාර්ශ්වයෙන් අදාළ මුදල අයකර ගැනීමට මෙතෙක් නොහැකි වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 94 ක් වූ අතර, ඉන් තනතුරු 19 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මටට්ටමේ තනතුරු 12 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 05 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් ද විය. | පසුගිය වසර කිහිපය තුළ රජයේ සේවයට බඳවා ගැනීම සීමා කිරීම හේතුවෙන් පවතින සේවක හිඟතාවය මත අනුප්‍රාප්තික නිලධාරීන් සොයාගැනීම දුෂ්කර වී ඇත. කෙසේ වෙතත් ඇතැම් තනතුරු සම්බන්ධ අවශ්‍යතාවය තවදුරටත් සලකා බලා සංශෝධනය කළ යුතු තනතුරු හඳුනා ගෙන එම තනතුරු 2024 වර්ෂයේ දී යටපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමටත්, එසේ නොවන තනතුරු තිබේ නම් ඒවා අනුමත කාර්ය මණ්ඩලයේ සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |